Department of Education Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - 10

ශ්‍රේණිය - 12

සකස් කළේ- කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

නිපුණතාව 2- ඉල්ලුම,සැපයුම,නම්‍යතාව හා වෙළෙඳපොළ සමතුලිතය විශ්ලේෂණය කරයි.

නිපුණතා මට්ටම 2.1 - ඉල්ලුම් තීරක ඇසුරින් ඉල්ලුම් න්‍යාය හා ඉල්ලුම් නීතිය විග්‍රහ කරයි.

**<u>ඉල්ලුම</u>** - නිශ්චිත කාලයක් තුළ ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩය සඳහා වූ විවිධ මිල ගණන් යටතේ මිලදී ගැනීමට අපේක්ෂා කරන විවිධ ප්‍රමාණ ඉල්ලුම ලෙස හැඳින්වේ.

ඉල්ලුම පහත පරිදි වර්ග කළ හැකිය.

1.පෞද්ගලික ඉල්ලුම

2.වෙළෙඳපොළ ඉල්ලුම

- නිශ්චිත කාලයක් තුළදී වෙළෙඳපොලේ සිටින සියලුම ගැනුම්කරුවන් විසින්,සලකා බලන භාණ්ඩය සඳහා පවතින විකල්ප මිල ගණන් යටතේ මිලදී ගැනීමට අපේක්ෂා කරන විවිධ ඉල්ලුම් ප්‍රමාණවල එකතුව වෙළෙඳපොළ ඉල්ලුම ලෙස හැඳින්වේ.

| පෞද්ගලික ඉල්ලුම තීරණය කරන සාධක | | වෙළෙඳපොළ ඉල්ලුම තීරණය කරන සාධක | |
|---|---|---|---|
| සලකා බලන භාණ්ඩයේ මිල | P | සලකා බලන භාණ්ඩයේ මිල | P |
| සම්බන්ධිත භාණ්ඩවල මිල | $P_n$ | සම්බන්ධිත භාණ්ඩවල මිල | $P_n$ |
| පාරිභෝගිකයාගේ ආදායම | Y | පාරිභෝගිකයාගේ ආදායම | Y |
| පාරිභෝගිකයාගේ රුචිය | T | පාරිභෝගිකයාගේ රුචිය | T |
| අනාගතය පිළිබඳ අපේක්ෂාවන් | $E_x$ | අනාගතය පිළිබඳ අපේක්ෂාවන් | $E_x$ |
| අනෙකුත් සාධක | O | ගැනුම්කරුවන් සංඛ්‍යාව හා එහි සංයුතිය | N |
| | | අනෙකුත් සාධක | O |

<u>අභ්‍යාස</u>

1.පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිතය යනු කුමක්ද?එය සමීකරණයක් මගින් දක්වන්න.
2. වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය යනු කුමක්ද?එය සමීකරණයක් මගින් දක්වන්න.
3.ඉල්ලුම් න්‍යාය යනු කුමක්ද?
4.ඉල්ලුම් නීතිය යනු කුමක්ද?
5.ඉල්ලුම් නීතිය ඉදිරිපත් කිරීමේදී සලකා බලන උපකල්පන මොනවාද?